සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය

ශිල්ප කලා - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය සපයා ඇති පිළිතුරු පත්‍රයේ කතිරයකින් සටහන් කරන්න.

---

01. කෝලම් රංගන, සොකරි නාට්‍යය අයත්වන ජන කලා වර්ගය කුමක්ද?
(1) ශ්‍රව්‍ය දෘශ්‍ය කලාව. (2) දෘශ්‍ය කලාව. (3) ශ්‍රව්‍ය කලාව. (4) රංග කලාව.

02. පහත දැක්වෙන කර්මාන්ත අතුරෙන් ශාන්ති කර්ම උදෙසා නිර්මාණය වූ ජන කලා කර්මාන්තය කුමක්ද?
(1) බිරළු කර්මාන්තය (2) ලක්ෂා කර්මාන්තය
(3) වෙස් මුහුණු කර්මාන්තය (4) පිත්තල කර්මාන්තය

03. පරිසර හිතකාමී හිස් වැසුම් නිෂ්පාදනය සඳහා භාවිතා කරන ශාක වර්ග සහිත පිළිතුර තෝරන්න.
(1) ඕක් කොළ හා ගොක් කොළ ය. (2) ඕක් කොළ හා තල් කොළ ය.
(3) ඉදි කොළ හා තල් කොළ ය. (4) ඉදි කොළ හා ඕක් කොළ ය.

04. විහිත චතුරස්‍ර භාවිතයෙන් නිර්මාණය කළ හැකි රේඛා වර්ග කිහිපයක් පහත දැක්වේ.
A - සරල රේඛා B - ලම්බ රේඛා C - ආනත රේඛා D - සමාන්තර රේඛා
(1) AB නිවැරදිය. (2) CD නිවැරදිය.
(3) AD නිවැරදිය. (4) ඉහත සියල්ලම නිවැරදිය.

05. පහත දක්වා ඇති රේඛා වර්ගය භාවිතා වන අවස්ථාව නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.



(1) වස්තුවක පෙනෙන දුර දැක්වීම සඳහා ය.
(2) සැඟි දුර දැක්වීම සඳහා ය.
(3) මිනුම් රේඛා දැක්වීම සඳහා ය.
(4) දීර්ඝ කිරීමේ රේඛා දැක්වීම සඳහා ය.

06. පහත ජ්‍යාමිතික නිර්මාණය අවශ්‍ය වන්නේ කුමන අවස්ථාව සඳහා ද?



(1) AB රේඛාව සමාන කොටස් වලට බෙදීමට ය.
(2) කඩදාසියක් සමාන තීරු 7 කට බෙදීමට ය.
(3) සරල රේඛාවක් සමාන කොටස් 7 කට බෙදීමට ය.
(4) 70 mm ක දිග සෙවීම සඳහා ය.

07. පහත දැක්වෙන වෘත්ත රටාව තුළ දැකිය හැකි වෘත්ත සංඛ්‍යාව කීයද?



(1) 30 කි
(2) 38 කි
(3) 36 කි
(4) 33 කි

08. පහත දක්වා ඇති කෝණ අතරින් 90^0 ට වැඩි අගයකින් යුතු කෝණ නිර්මාණය වන්නේ,



(1) (2) (3) (4)

09. පහත දැක්වෙන ජ්‍යාමිතික නිර්මාණය තුළ දැකිය හැකි බහු අස්‍ර මොනවාද?



(1) ත්‍රිකෝණය හා චතුරස්‍රය
(2) ත්‍රිකෝණය හා ෂඩ්කෝණාස්‍රය
(3) ත්‍රිකෝණය හා සමචතුරස්‍රය
(4) ත්‍රිකෝණ හා ත්‍රිපීසියමය

10. පහත රූප සටහන් අතරින් ඇල සමාන්තරාස්‍රය ලෙස හඳුන්වන රූප සටහන කුමක්ද?



(1) (2) (3) (4)

11. විධිමත් ලෙස නිර්මාණය කරන බහු අස්‍රය දැකිය හැකි ලක්ෂණයකි,
(1) පාද හා කෝණවල සමාන වීම.
(2) පාද අසමාන වීම හා කෝණ සමාන වීම.
(3) සමබර බව හා කෝණ අසමාන වීම.
(4) කෝණ හා පාදවල අසමාන වීම.

12. පහත දැක්වෙන රූප සටහන් අතරින් මූලික ඝන වස්තුවලට අදාළ රූප සටහන තෝරන්න.



(1) (2) (3) (4)

13. රෙදි පිළි අලංකරණයේදී සායම් ආලේපනය වැනි ක්‍රමවේද භාවිත කරනු ලැබේ. සායම් පෙවීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
(1) බාහිර උපකරණ ඇසුරින් රෙද්ද මත සායම් සහිත මුද්‍රා තැබීමය.
(2) මුළු පෙහෙකම් ද්‍රව්‍ය පුරාම වර්ණ පැතිර යාමයි.
(3) තෝරාගත් ප්‍රදේශයක බාහිර උපකරණයක් මගින් සායම් ආලේපනය කිරීමයි.
(4) මුළු රෙද්ද පුරාම කැඳ යෙදීමයි.

14. අතීතයේ සිතුවම් වර්ණ ගැන්වීමට පරිසරයේ අමුද්‍රව්‍ය භාවිතා කරන ලදී. කහ වර්ණය ලබා ගැනීම සඳහා යොදාගත් අමුද්‍රව්‍ය වන්නේ,
(1) ගොකටු ගසේ කිරි
(2) මකුළු මැටි
(3) නිල් අවරිය කොළ
(4) අඳුන් දැලි

15. කෘතිම වර්ණ කාණ්ඩයට අයත් වන්නේ පහත කුමන කාණ්ඩයද?
(1) නිල්, කහ, රතු
(2) නිල්, දම්, කහරඹ, රතු
(3) දම්, කොළ, තැඹිලි
(4) රතු දම්, නිල් දම්, රතුරඹ

16. වර්ණ සංකලනයේදී වර්ණවල පාරදෘශ්‍ය බව ඇතිකර ගැනීම සඳහා කරනු ලබන්නේ පහත කරුණු වලින් කුමක්ද?

(1) වර්ණයකට සුදු වර්ණයක් එක් කර ගැනීම (2) වර්ණයකට කළු පැහැය එක් කිරීම
(3) වර්ණයකට ජලය එකතුකර ගැනීම (4) වර්ණයකට රතුපැහැය එකතු කිරීම

17. තුනී පාර දෘශ්‍ය සායම් පදාසයක් ආලේප කිරීම හඳුන්වන්නේ,

(1) යටි ආලේපය නමිනි (2) සේදුම නමිනි
(3) අධි ආලෝකය නමිනි (4) අඳුකරණය නමිනි

18. ස්වභාවික අමුරෙදිවල පවතින දුඹුරු පැහැය ඉවත් කර සුදු පැහැය ලබා ගැනීමට සිදුකරන්නා වූ රසායනික ක්‍රියාවලිය වන්නේ,

(1) කැඳ හරණය (2) මළහරණය (3) කාබනිකරණය (4) විරංජනය

19. කෘතිම ක්ෂාලයක් වන්නේ,

(1) කෝස්ටික් සෝඩා (2) සබන් (3) සල්ෆියුරික් අම්ලය (4) ලුණු

20. විශාල ප්‍රදේශ වර්ණ ගැන්වීමේදී භාවිත කරන 1/2 cm, 1 cm, 2 cm ආදී ලෙස අංකනය කර ඇති පින්සල් හඳුන්වන්නේ කුමන නමකින්ද?

(1) රවුම් පින්සල් (2) පැතලි පින්සල් (3) විශාල සේදුම් පින්සල් (4) සියුම් නිමා පින්සල්

21. අතීතයේ නූල් කැටීම සඳහා භාවිතා කරන ලද උපකරණයක් වන්නේ,

(1) පෙලන දුන්න (2) නක්ලීය (3) නූල් අදින කටුව (4) පෙලන බුරුසුව

22. සතුන්ගෙන් ලෝම ලබා ගැනීමේදී ඇංගෝරා එළුවන්ගෙන් ලබා ගන්නා ලෝම හඳුන්වන්නේ කිනම් නමකින්ද?

(1) ලෝම කෙඳි නමිනි (2) මොහේයාර් නමිනි (3) දික් ලෝම නමිනි (4) කෙටි ලෝම නමිනි

23. කෙඳි වර්ග හඳුනා ගැනීම සඳහා විවිධ පරීක්ෂණ කරනු ලබයි. හණ කෙඳි පැල්ලම් පරීක්ෂාවට භාජනය වූ පසු ඇතිවන පාට වන්නේ,

(1) දම් පාට (2) රන්වන් දුඹුරු පාට (3) දුඹුරු පැහැති දම්පාට (4) දුඹුරු පාට

24. රෙදි විවීමේදී රටා වර්ගයන් භාවිත කරනු ලැබේ. චාම් රටාවේ ප්‍රභේද ගණන හඳුන්වනුයේ,

(1) චාම්, ජටාජටා, දික්දාර, හරස් දාර, දික්හීරි (4) සරලහීරි, දඟර හීරි, චාම් රටා

25. රූප සටහනින් පෙන්වනනේ එක් දික් නූලක් සමග හරස් නූල් දෙකක් හෝ තුනක් සම්බන්ධ වූ රටාවකි. එම රටාව හඳුන්වන නම කුමක්ද?

(1) හරස් දාර වියමන
(2) චාම් වියමන
(3) ජටා වියමන
(4) දික්දාර වියමන



26. පට පණු කෝෂ වලින් ලබා ගන්නා සේද කෙඳිවල ව්‍යුහය සකස් වී ඇත්තේ කිනම් රසායනික ද්‍රව්‍යයකින්ද?

(1) මැලියම් නමිනි (2) සල්ෆියුරික් අම්ලය නමිනි
(3) ජම්බොයින් නමිනි (4) කාබනිකරණය නමිනි

27. රෙදි පිළි සායම් කිරීම, ආලේප කිරීම හා මුද්‍රණ කිරීමෙන් පසු සායම් ස්ථිර කර ගැනීම සඳහා යොදා ගන්නා ක්‍රමවේදය හඳුන්වන්න.

(1) පසු පිරියම් කිරීම (2) පෙර පිරියම් කිරීම (3) කැඳ හරණය කිරීම (4) මළහරණය කිරීම

28. හණ පැළෑටියෙන් ලබා ගන්නා කෙඳි ඉතාමත් දිලිසෙන ගතියෙන් හා ශක්තිමත් බවින් යුක්තය. එම කෙඳි ලබා ගන්නේ හණ ගසේ කිනම් කොටසින්ද?

(1) පත්‍ර වලින් (2) ගෙඩිවලින් (3) කඳ කොටසින් (4) මුල් වලින්

29. ජලාකර්ෂණතාව විද්‍යුත් ආරෝපණයට දක්වන ප්‍රතිරෝධය හා තාප බලපෑම්වලට දක්වන ප්‍රතිරෝධය ඉහළ මට්ටමක පවතින කෙඳි වර්ගය කුමක්ද?

(1) ලෝම කෙඳි (2) කපු කෙඳි (3) හණ කෙඳි (4) නියඳ කෙඳි

30. කෙඳි හඳුනා ගැනීමේ පරීක්ෂයේදී ඛනිජ කෙඳි කඩා බැලීමේ පරීක්ෂාවේදී ඇතිව ලක්ෂණය වනුයේ,

(1) ඇදෙන ගතිය නැත (2) නම්‍යතාවය නැති වීම (3) වහා කැඩෙන සුළු බව (4) හැකිලීම සිදු නොවේ

31. ප්‍රාථමික මැටි භාවිතයෙන් කෙරෙන නිෂ්පාදන ඇතුලත් පිළිතුර තෝරන්න.
   (1) පුයර, දන්තාලේප, බෙහෙත් දවටන, තාප පරිවාරක උපකරණ
   (2) තීන්ත, පොහොර, වළං, උළු, ගඩොල්
   (3) වළං, උළු, පිඟන් ගඩොල්, සෙරමික් භාණ්ඩ
   (4) පෝසිලේන්, සෙරමික් භාණ්ඩ, වළං, හට්ටි මුට්ටි

32. ඉතා උසස් තත්වයේ කෙබලින් මැටි නිධිය පිහිටා ඇත්තේ,
   (1) කැළණිය මොළගොඩය.
   (2) බෙරලැස්ගමුව ප්‍රදේශයේ ය.
   (3) මීටියාගොඩ ප්‍රදේශයේ ය.
   (4) පිදුරුවැල්ල ප්‍රදේශයේ ය.

33. මැටි ජලය සමඟ එක් වීමේදී ඇතිවන ඇලෙන සුලු බව හඳුන්වන්නේ,
   (1) සවිවරතාවය
   (2) සුවිකාර්යතාවය
   (3) හැකිලීම
   (4) නම්‍යතාවය

34. බංගදෙණිය, අනුරාධපුරය, ගල්ඔය සහ ඔඩ්ඩු සුඩාන් ප්‍රදේශ වල පිහිටි මැටි නිධි අයත් කලාපය වන්නේ,
   (1) තෙත් කලාපීය
   (2) උතුරු කලාපීය
   (3) අන්තර් කලාපීය
   (4) වියළි කලාපීය

35. උළු කර්මාන් ශාලාවල නිපදවන බිම් උළු නිපදවීම සඳහා යොදාගන්නේ,
   (1) වියළි මැටි ලෙස මිශ්‍ර කර ගැනීමෙනි
   (2) තෙත මැටි ලෙස මිශ්‍ර කර ගැනීමෙනි
   (3) වාත්තු මැටි ලෙස මිශ්‍ර කර ගැනීමෙනි
   (4) දියර මැටි ලෙස මිශ්‍ර කර ගැනීමෙනි

36. පදම් කල මැටි ගබඩා කිරීම සඳහා සුදුසුම ක්‍රමය වන්නේ,
   (1) පොලිතීන් කොළයක ඔතා තැබීම
   (2) ජලය දැමූ භාජනයක දමා තැබීම
   (3) ගොඩගසා ඉටි රෙද්දකින් වඩා තැබීම
   (4) මැටි පෙට්ටියේ දමා තබා ගැනීම

37. මහා පරිමාණ කර්මාන්ත ශාලාවල මැටි පදම් කිරීමේදී මැටිවල ඇති වැඩි ජලය ඉවත් කිරීම සඳහා යොදා ගන්නා යන්ත්‍රය වන්නේ,
   (1) රෝලර් ක්‍රෂර්
   (2) බෝල් මිල්
   (3) ෆිල්ටර් ප්‍රෙෂ්
   (4) පග්මිල් යන්ත්‍රය

38. මැටි තහඩු හා දරණු භාවිතයෙන් භාණ්ඩයක් සෑදීමේදී එම දරුණු හා තහඩු අලවා ගැනීම සඳහා භාවිතා කරන ද්‍රව්‍ය වන්නේ,
   (1) පාප්ප ය
   (2) මැටි පාප්ප ය
   (3) බයින්ඩර් ගම් ය
   (4) සුපර්ග්ලු ය

39. මැටි තහඩු භාවිතයෙන් කැටයම් කිරීමේදී මැටි තහඩුවේ ගැඹුරටම හාරා මතුකර ගන්නා කැටයම් ක්‍රමය වන්නේ,
   (1) අල්ප උන්නත කැටයම් ය.
   (2) අර්ධ උන්නත ය.
   (3) අධි උන්නත කැටයම් ය.
   (4) පූර්ණ උන්නත ය.

40. ඇඹීමේ ක්‍රමයෙන් මැටි භාණ්ඩයක් නිර්මාණය කිරීමේදී යොදා ගත හැකි මාධ්‍ය පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
   (1) මැටි, සිමෙන්ති, ප්ලාස්ටර් ඔෆ් පැරිස් ය.
   (2) කළු ගල්, තිරිවානා ගල්, රත්තරන් ය.
   (3) සිමෙන්ති, පල්ප, කළු ගල් ය.
   (4) කළු ගල්, තිරුවානා, පල්ප ය.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය **ශිල්ප කලා - II** කාලය පැය 2 යි

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) තක්ෂිලා මහා විද්‍යාලයේ වාර්ෂිකව පවත්වනු ලබන කලා උළෙල මෙම වසරේ උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට තීරණය කරන ලදී. එහි සියලු සැරසිලි හා ඇඳුම් නිර්මාණ විද්‍යාලයේ ශිල්පකලා විෂය හදාරන සිසුන්ට පැවරුණි.

i. මෙම උත්සවය පැවැත්වීමේදී සැරසිලි යොදාගත හැකි ස්ථාන 02 ක් ලියන්න.

ii. මෙම සැරසිලි සඳහා යොදාගත හැකි අමුද්‍රව්‍ය 04 ක් ලියන්න.

iii. මෙම උළෙලේ සැරසිලි සඳහා යොදාගත හැකි අපතේ යන ද්‍රව්‍ය 04 ක් ලියන්න.

iv. වේදිකාව සඳහා යොදා ගත හැකි සරල කැටයමක රූප සටහනක් අඳින්න.

v. උත්සව ශාලාව අලංකාර කිරීම සඳහා යොදාගත හැකි ජ්‍යාමිතික හැඩතලයක් සහිත නිර්මාණයක් අඳින්න.

vi. මේස රෙද්ද අලංකාර කිරීමට අච්චු මුද්‍රණය යොදා ගන්නේ නම් ඒ සඳහා යොදා ගත හැකි ස්වභාවික ද්‍රව්‍ය 02 ක් ලියන්න.

vii. සැරසිලි සඳහා කැටයම් නිර්මාණය කිරීමට හැකි ස්වභාවික අමුද්‍රව්‍ය 02 ක් ලියන්න.

viii. කලා උළෙලේ සංවිධායක කමිටුව එකම ආකාරයේ ඇඳුම් අඳින ලදී. ඇඳුම් සඳහා සුදුසු මෝස්තරයක් අඳින්න.

ix. කලා උළෙලේ වෙස් මුහුණු පැළඳගෙන නැටූ නර්තනයක් ද දක්නට ලැබුණි. ඒ සඳහා යොදා ගත් වෙස් මුහුණු 02 ක නම් ලියන්න.

x. ආරාධිත අමුත්තන්ට දුන් සමරු ඵලකය සඳහා අලංකාර නිර්මාණයක් අඳින්න.

(ලකුණු 2x10=20)

(02) ජන කලාව මිනිස් අවශ්‍යතා පදනම් කරගෙන ආරම්භ වූවකි.

i. ඔබ ප්‍රදේශයේ දැකිය හැකි ජනකලා කර්මාන්ත 02 ක් නම් කරන්න. (ල.02)

ii. ශ්‍රව්‍ය කලාවට අයත් ඔබ කැමති ජනකවියක් ලියන්න. (ල.04)

iii. ජනකලා සුරැකීමට රාජ්‍ය මට්ටමෙන් ගෙන ඇති පියවර 04 ක් ලියන්න. (ල.04)

(03) විසිතුරු භාණ්ඩ සෑදීමේදී ජ්‍යාමිතික හැඩතල පිළිබඳව අවබෝධයක් අප තුළ තිබිය යුතුය.

i. පාදවල දිග අනුව ත්‍රිකෝණ වර්ග කරන්න. (ල.02)

ii. සමචතුරස්‍රය හා ඍජු කෝණාස්‍රයේ ලක්ෂණ 02 ක බැගින් වෙන වෙනම ලියන්න. (ල.04)

iii. පහත රූප සටහන ත්‍රිමාන කර දක්වන්න. (ල.04)

(04) රෙදි පිළි අලංකරණයේදී සායම් වර්ග හා වර්ණ සංකලනය පිළිබඳ දැනුවත් වීම වැදගත්ය.

i. සායම් ආලේපන සිදුකරන ආකාරය ලියන්න. (ල.02)

ii. මූලික වර්ණ සංකලනය තුළින් ද්විතීයික වර්ණ සකස්කර ඇති ආකාරය ලියන්න. (ල.04)

iii. සිදුරු තහඩු මුද්‍රණය මගින් මේස රෙද්දක් අලංකාර කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල.04)

(05) රෙදි නිෂ්පාදන ක්‍රියාවලියේදී විවිධ කෙඳි වර්ග භාවිත කරයි.

i. පේෂ කර්මාන්තය සඳහා යොදා ගන්න ප්‍රධාන අමුද්‍රව්‍ය 04 ලියන්න. (ල.02)

ii. ඉහතින් ඔබ දැක්වූ එක් අමු ද්‍රව්‍යකට උදාහරණ 04 ක් ලියන්න. (ල.04)

iii. හැඩ පෙති (ටැබ්ලට්) බාවිත කර වියාගත හැකි නිෂ්පාදන 06 ක් ලියන්න. (ල.04)

(06) මැටි නිර්මාණය වීම භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක හේතූන්ගේ බලපෑම මත සිදුවේ.

i. පාෂාණ ජීර්ණයට හේතුවන ස්වභාවික හේතු 04 ක් ලියන්න. (ල.02)

ii. මැටිවල අඩංගු සංඝටක සංයුතිය අවුයව මැටි වර්ග කර දක්වන්න. (ල.04)

iii. මැටිවල පවතින භෞතික හා රසායනික ගුණ මොනවාද? (ල.04)

(07) මැටි භාවිත කර විවිධ ශිල්ප ක්‍රම මත භාණ්ඩ සාදයි.

i. මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රම 04 ක් නම් කරන්න. (ල.02)

ii. ඉන් එක් ක්‍රමයකට මැටි භාණ්ඩ සාදා ගන්නා ආකාරය පියවර ලෙස ලියන්න. (ල.04)

iii. කැටයම් කපා අලංකාර කරන ලද මැටි බඳුනක රූප සටහනක් අඳින්න. (ල.04)

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව **දෙවන වාර පරීක්ෂණය 2018**

10 ශ්‍රේණිය **ශිල්ප කලා**

පිළිතුරු පත්‍රය - I කොටස

01. (1)	02. (3)	03. (3)	04. (4)	05. (2)	06. (3)	07. (4)	08. (4)	09. (3)	10. (4)
11. (1)	12. (1)	13. (2)	14. (1)	15. (4)	16. (3)	17. (2)	18. (4)	19. (2)	20. (2)
21. (2)	22. (2)	23. (3)	24. (2)	25. (4)	26. (3)	27. (1)	28. (3)	29. (1)	30. (3)
31. (1)	32. (3)	33. (2)	34. (4)	35. (1)	36. (4)	37. (3)	38. (2)	39. (3)	40. (1)

II පත්‍රය

(01) i. උත්සවයේ පිවිසුම් දොරටුව, නිවේදක පුවරුව, වේදිකාව දෙපස, වේදිකාවේ බිත්ති ආදිය.
ii. ගොක්කොළ, මල් වර්ග, කෙසෙල් කොළ, විසිතුරු ශාක පත්‍ර ආදිය.
iii. පොල් කුඩු, තේ කුඩු, දහයියා, ලී කුඩු, කඩදාසි ආදිය.
iv. සුදුසු රූප සටහන් දෙකකට ලකුණු ලබා දෙන්න.
v. සුදුසු ජ්‍යාමිතික හැඩතලයන්ට ලකුණු ලබා දෙන්න.
vi. නෙළුම් අල, බණ්ඩක්කා, කෙසෙල් පිති, අල පෙති ආදිය.
vii. අර්තාපල්, කැරට් අල, කිරි අල, රාබු අල ආදිය.
viii. සුදුසු මෝස්තරයකට ලකුණු ලබා දෙන්න.
ix. කෝලම් නාට්‍යයේ වෙස් මුහුණු, මනමේ බිසව, ගිරිදේව, නාග රාජ ආදිය.
x. සුදුසු මෝස්තරයකට ලකුණු දෙන්න. (2 x 10 = 20)

(02) i. ජනකලා කර්මාන්ත ලියා තිබේනම් ලකුණු දෙන්න.
ii. සුදුසු ජන කවියකට ලකුණු දෙන්න.
iii. ජන කලා නිර්මාණ සඳහා ජනපද පිහිටුවීම, ජන කලා නිර්මාණ අලෙවි කිරීමට ආයතන පිහිටුවීම, විදේශිකයන්තු ළ අත්කම් නිර්මාණ ප්‍රචලිත කිරීම, දිවා රාත්‍රි කාලයේ ක්‍රියාත්මක වන අත්කම් ප්‍රදර්ශන පැවැත් වීම, ස්වයං රැකියා සඳහා සහන පොලියට ණය ලබා දීම, ''අපේ ගම'' පිහිටුවීම.

(03) i. සමද්විපාද, සමපාද, විෂම පාද ත්‍රිකෝණ
ii. සමචතුරස්‍රය - සම්මුඛ පාද සමාන්තරයි, විකර්ණ දිගින් සමාන සහ එකිනෙකට ලම්බකව සමච්ඡේදනය වේ, විකර්ණ මගින් ශීර්ෂ කෝණ සමච්ඡේදනය වේ.
ඍජු කෝණාස්‍රය - සම්මුඛ පාද සමාන්තර වේ, විකර්ණ එකිනෙකට සමච්ඡේදනය වේ, විකර්ණ දිගින් සමාන වේ.
iii. 

(04) i. රෙද්දක තෝරා ගත් ප්‍රදේශයන්හි බාහිර උපකරණයක් මගින් සායම් ගැල්වීමයි.
ii. නිල් හා රතු මිශ්‍ර වීමෙන් දම් වර්ණය නිල් හා කහ මිශ්‍ර වීමෙන් කොළ වර්ණය
කහ හා රතු මිශ්‍ර වීමෙන් තැඹිලි වර්ණය
iii. සුදුසු මෝස්තරයකට ලකුණු ලබා දෙන්න.

(05) i. ශාක, සත්ව, ඛනිජ, කෘත්‍රිම
iii. ශාක - හණ, නියඳ, මැනිලා, රැමී, ජුට්, සීසල්, පෙනා
සත්ව - සේද, බැටළුවා, ඇගෝරා, එළුවා, ලාමා, ඔටුවා, විකුණා
ඛනිජ - ඇස්බැස්ටෝස්, රන්, රිදී, විදුරු
කෘත්‍රිම - පොලියස්ටර්, පොලිමටීඩ්, නයිලෝන්
iii. විසිතුරු ඉන පටි, මිත්‍රත්ව පටි, ඔරලෝසු පටි, පහන් තිර, ඇලිස් බෑන්ඩ් ආදිය.

(06) i. සූර්ය තාපය, වර්ෂාව, විදුලි කෙටීම, ආර්ද්‍රතාව, හිමපතනය ආදිය.
iii. 

iii. සුවිකාර්යතාව, සච්ඡිද්‍රතාවය, හැකිළීම, වර්ණය

(07) i. ඇඹීම, දරණු, අච්චු, තහඩු, වත්තු ක්‍රම
ii. පියවර වශයෙන් ලියා තිබේනම් ලකුණු දෙන්න.
iii. සුදුසු රූ සටහනකට ලකුණු ලබා දෙන්න.